පොලිස්පති ගෙන්,

සියළුම:- ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්,
නියෝජ්‍ය පොලිස්පතිවරුන්,
කොට්ඨාස භාර නිලධාරීන්,
අධ්‍යක්ෂවරුන්,
අණදෙන නිලධාරීන්:
ක්ෂේත්‍ර බලකා මූලස්ථානය / වි.කා.බ.
දිස්ත්‍රික්ක භාර නිලධාරීන්,
මූ.පො.ප. / ස්ථානාධිපතිවරුන්,
(ක්‍රියාකාරී / ප්‍රාදේශීය කොට්ඨාස)

INFORMATION TECHNOLOGY DIVISION
18 MAY 2021
POLICE HEADQUARTERS

**පොලිස් කොස්තාපල් / කාන්තා පොලිස් කොස්තාපල් තනතුරේ සිට පොලිස් සැරයන්/ කාන්තා පොලිස් සැරයන් තනතුරට උසස් කිරීමේ සීමිත තරඟ විභාගය - 2020 .**

**01.** 2020.10.23 දිනැති ජාතික පොලිස් කොමිෂන් සභාවේ අංක NPC/ED/NG/06/SOR/07/2020 (VOL.I.II.III) දරණ ලිපිය මගින් ශ්‍රී ලංකා පොලීසියේ විධායක සේවා හා නියාමන සේවා සඳහා වන බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පටිපාටිය අනුව පොලිස් කොස්තාපල් / කාන්තා පොලිස් කොස්තාපල්තනතුරේ සිට පොලිස් සැරයන් /කාන්තා පොලිස් සැරයන් තනතුරට උසස්වීම් ලබාදීම සඳහා 2020.12.31 දිනට පහත සඳහන් මූලික සුදුසුකම් සම්පූර්ණ කර ඇති පොලිස් කොස්තාපල් / කාන්තා පොලිස් කොස්තාපල් නිලධරයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (මෙම පටිපාටිය පොලිස් වෙබ් පිටුවේ ඇතුළත්ව ඇත)

**02.** **යෝග්‍යතාවය :** පොලිස් කොස්තාපල් තනතුරේ සක්‍රිය සේවා කාලය වසර 08 ක් සම්පූර්ණ කරන නිලධරයින්ට මේ සඳහා අයදුම් කළ හැක. (සහායකසේවා / වැඩ අංශයේ හෝ යම් විශේෂිත වෘත්තියකට බඳවාගන්නා ලද නිලධරයන් මේ සඳහා සුදුසුකම් නොලබයි.)

**03.** **සපුරාලිය යුතු සුදුසුකම්.**

3.1 පොලිස් කොස්තාපල් තනතුරේ පත්වීම ස්ථිර කර තිබීම.

3.2 පොලිස් කොස්තාපල් තනතුරේ අවම වශයෙන් විශේෂ වැටුප් වර්ධක හැර වැටුප් වර්ධක 08 ක් උපයාගෙන තිබීම.

3.3 උසස් කිරීමේ දිනට පූර්වාසන්නතම වසර 03 තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

එසේ වුවද, සතුටුදායක සේවා කාලය ගණනය කිරීමේදී දඩුවම ක්‍රියාත්මක වන දින සිට, අසාධු සටහනකට අදාළව මාස 02 ක්ද, විනයශාලා වෙනත් දඬුවමකට අදාළව මාස 06 ක කාලයක්ද, ආයතන සංග්‍රහයේ දෙවන උපලේඛනය යටතේ දෙනු ලබන දඬුවමකට අදාළව වසරක කාලයක් ද, නොසළකා හරිනු ලැබේ.

3.4 අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටියට අනුව උසස්වීමේ දිනට පෙරාතුව වූ වසර 05 තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

3.5 අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීනතාව ලබාගෙන තිබීම.

3.6 අයදුම්පත් කැඳවන අවසන් දිනට පූර්වාසන්න වසරක කාලයක් තුළ ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයකට පෙනී සිට ඉන් සමත් වී තිබීම.

**04.** **උසස් කිරීමේ ක්‍රමය.**

4.1 සීමිත තරඟ විභාගයෙන් ලබාගන්නා මුළු ලකුණු සංඛ්‍යාවට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයෙන් ලබාගන්නා ලකුණු එකතු කර අයදුම්කරුවන්ගේ ලකුණු අවරෝහණ ක්‍රමයට සකස් කර පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව සුදුස්සන් තෝරා ගනු ලැබේ.

05. **අයදුම්පත් ඉදිරිපත් කිරීම.**

5.1 කොට්ඨාස භාර නිලධාරීන් / අධ්‍යක්ෂවරුන් විසින් තම කොට්ඨාසයට අනුයුක්ත ස්ථානාධිපතිවරුන් ලවා ඉහත මූලික සුදුසුකම් සපුරා ඇති නිලධරයන්ට විශේෂ උපදෙස් පංතියක් පවත්වා මේ පිළිබඳව ඔවුන් දැනුවත් කළ යුතුය. ඉන් පසු ඉහත සුදුසුකම් සපුරා ඇති නිලධරයන් මගින් අයදුම්පත් සම්පූර්ණ කර ස්ථානාධිපති / ස.පො.අ. / කොට්ඨාස භාර නිලධාරීගේ නිර්දේශය සහිතව 2021.06.01 දින පැය 1500 ට පෙර අධ්‍යක්ෂ / පොලිස් විභාග කොට්ඨාසය, අංක 234, චොක්ෂෝල් වීදිය, කොළඹ 02 ලිපිනයට, කොට්ඨාසයෙන් අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධරයන්ගේ නාම ලේඛණය සහිත ආවරණ ලිපියක් සමග තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදීමට කටයුතු කළ යුතුය.

5.2 අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, අයදුම්පත්‍රය හෝ ඊට සම්බන්ධිත ලේඛණයක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සළකා බලනු නොලැබේ. අවසන් දිනය වන විට අයදුම්පත් ඉදිරිපත් නොකිරීමෙන් සිදුවිය හැකි අගතිය සම්බන්ධයෙන් කොට්ඨාස භාර නිලධාරීන් / අධ්‍යක්ෂවරුන් වගකිව යුතු වන හෙයින් , එවැනි තත්වයක් උද්ගත නොවීමට ඔවුන් වගබලා ගත යුතුය. නියමිත දිනට අයදුම්පත් ඉදිරිපත් කිරීම කොට්ඨාස භාර නිලධාරීන්ගේ හා අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ.

5.3 ඔබ කොට්ඨාසයට අනුයුක්තව සිටින යම් නිලධරයකු එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදා රාජකාරි වල නිරතව / වැඩ තහනම්/ දීර්ඝ අසනීප නිවාඩු / ප්‍රසූත නිවාඩු / අනුමත විදේශ නිවාඩු/ විශේෂ රාජකාරි / තාවකාලික අනුයුක්ත කිරීම්/ විශ්‍රාම පූර්ව නිවාඩු/ කොරෝනා වෛරසය හේතුවෙන් නිරෝධායනය වන හෝ ඉහත සුදුසුකම් සපුරණ නිලධරයන් සිටීනම් එම නිලධරයින් ප්‍රමාදයකින් තොරව මේ පිළිබඳව සනාථ කරගත හැකි පරිදි දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය.

5.4 තාවකාලික ස්ථාන මාරුවීම් ලබා සිටින නිලධරයන් ඔවුන් ස්ථිරවම අනුයුක්ත කොට්ඨාසය මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

5.5 ආදර්ශ අයදුම්පත්‍රය මේ සමග ඇමුණුම A වශයෙන් යාකර ඇති අතර, ලිඛිත විභාගය පැවැත්වෙන ආකාරය පහත පරිදි වේ.

06. **විෂය නිර්දේශය.**

| **ප්‍රශ්න පත්‍රය/ විෂය ක්ෂේත්‍රය** | **කාලය** | **උපරිම ලකුණු ප්‍රමාණය** | **සමත් ලකුණු ප්‍රමාණය** |
|---|---|---|---|
| 1. නීතිය | පැය 02 | 100 | 40% |
| 2. ප්‍රායෝගික පොලිස් විධි | පැය 02 | 100 | 40% |
| 3. බුද්ධි පරීක්ෂණය | පැය 02 | 100 | 40% |

07. **සමත්වීම සඳහා ලකුණු.**

විෂයන් තුනම සමත්වීම ලිඛිත විභාගය සමත් ලෙස සලකනු ලැබේ.

08. **විභාග ප්‍රවේශ පත්‍ර.**

සියළුම විභාග ප්‍රවේශ පත්‍ර කොට්ඨාස භාර නිලධාරීන් හෝ අධ්‍යක්ෂවරුන් වෙත විභාග කොට්ඨාසය මගින් බාරදෙනු ලබන අතර, ප්‍රවේශ පත්‍ර රැගෙන යාම සඳහා දුරකථන පණිවිඩයක් මගින් දැන්වූ පසු වගකිව යුතු නිලධාරියෙකු විභාග කොට්ඨාසය වෙත එවීමට කටයුතු කළ යුතුය.

09. **විභාගය පැවැත්වීම.**

අධ්‍යක්ෂ / විභාග විසින් කොළඹදී හෝ කොළඹින් පිටතදී තෝරාගත් විභාග මධ්‍යස්ථාන වලදී පැවැත්වීමට කටයුතු කරනු ඇත.

සී.ඩී. වික්‍රමරත්න,
පොලිස්පති.
2021.05.15

සී. ඩී. වික්‍රමරත්න
පොලිස්පති
පොලිස් මූලස්ථානය
කොළඹ 01